**31-12-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, වඩාත්ම පූජනීය වූ පියාගේ නිවහන වන්නේ මධුබාන්ය. ඔබ කිසිම අපවිත්‍ර කෙනෙක්ව මෙහි රැගෙන නොආ යුතුයි.

**ප්‍රශ්නය:** මෙම දේවමය දූත මෙහෙය පිළිබඳව ස්ථිර විශ්වාසයක් ඇති අයගේ සළකුණු මොනවාද?

**පිළිතුර:** 1. ඔවුන් ප්‍රශංසා මෙන්ම අපහාස ලැබීමේදී, බොහෝ සේ ඉවසිලිමත්ය. 2. ඔවුන් කිසිම විටෙක කෝප නොගනී. 3. ඔවුන් ශාරීරික අවධානයේ දැක්මකින් කිසි කෙනෙක් දෙස නොබලයි. 4. ඔවුන් අන් අය ජීවාත්ම ලෙස දකින අතර, තමන් ජීවාත්මයක් බව සලකා, අන් අය සමඟ කතා කරයි. 5. එකට වාසය කරන අතර, සැමියා සහ බිරිඳ, නෙළුම් මල් මෙන් රැඳී සිටියි. 6. ඔවුන්ට කිසිම ආකාරයක ආශාවක් නැත.

**ගීතය:** සලබයන් තමන්ව කැප නොකරන්නේ මන්ද?

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා, ආධ්‍යාත්මික දරුවන්ට විස්තර කරයි, එනම්, පරමාත්ම දෙවියන් ආධ්‍යාත්මික ශිෂ්‍යයන්ට උගන්වයි. එම පාසැල් වල ඉගෙන ගන්නා ශිෂ්‍යයන්, ආධ්‍යාත්මික ශිෂ්‍යයන් ලෙස හැඳින්වෙන්නේ නැත ඔවුන් අයත් වන්නේ දූෂිත සමාජයටයි. පෙරකල ඔබත් රකුසු විය, එනම් ඔබ අයත් වූයේ රාවණගේ සමාජයටයි. ඔබ දැන් රාමාගේ රාජධානියට යෑම සඳහා, රාවණ වන පාපයන් පහ, පරාජය කිරීමට උත්සාහ දරනවා. ඔවුන් සිටින්නේ රාවණගේ සමාජයේ බව, මෙම ඥානය ලබා නොගන්නා අයට ඔබ විස්තර කළ යුතුයි. ඔවුන්ට මෙය නොවැටහෙයි. ඔබ අසීමිත පියා සමඟ ඉගෙනගන්නා බව, ඔබගේ නෑදෑ මිතුරන්ට ඔබ පැවසූ විට, ඉන් කියැවෙන්නේ ඔවුන්ට එම විශ්වාසය තිබෙනවා කියා නොවෙයි. ඔබ, පරමාත්ම පියා හෝ පරමාත්ම දෙවියන් කතා කරන බව කෙතරම් කීවත්, ඔවුන්ට එම විශ්වාසය නොතිබෙයි. අළුත් අයට මෙහි පැමිණීමට අවසර නැත. ලිපියක් නොමැතිව හෝ අවසර නොගෙන, කිසි කෙනෙකුට මෙහි පැමිණිය නොහැක. කෙසේවෙතත්, සමහර අවස්ථාවන්හිදී ඔවුන් පැමිණෙයි. මෙයද නීතිය කඩ කිරීමකි. ඔබ සෑම කෙනෙකුගේම පුවත්, ඔවුන්ගේ නම් ආදිය සමඟ ලියා, එම කෙනාව එවීමට ඔබ අවසර ඉල්ලිය යුතුයි. එවිට බාබා මෙසේ පිළිතුරු දෙයි ඔබට ඔහු එවිය හැක. එම කෙනා අපවිත්‍ර, රකුසු ලෝකයේ ශිෂ්‍යයෙක් නම්, එම ඉගෙනුම උගන්වන්නේ දූෂිත, අපවිත්‍ර අය විසින් බවත් මෙම ඉගෙනුම පරමාත්ම දෙවියන් උගන්වන බවත්, පියා විස්තර කරදෙයි. එම ඉගෙනුම තුළින් ඔබට ලැබෙන්නේ පැන්ස කිහිපයක් වටිනා තත්ත්වයක් පමණයි. කෙනෙක් බොහෝ වැදගත් විභාගයක් සමත් වන නමුත්, ඔහුට කෙතරම් කාලයක් ආදායමක් උපයාගැනීමට හැකි වෙයිද? විනාශය අත ළඟය. ස්වභාවික ව්‍යසනද පැමිණෙයි. ඔබට මෙය වැටහෙයි. පිටත සිටින, මෙය නොවැටහෙන අයටද, ආගන්තුක කුටියේදී ඔබ මෙය විස්තර කළ යුතුයි. මෙය දේවමය අධ්‍යයනයකි. මෙහි, තම බුද්ධිය තුළ විශ්වාසය ඇති අය පමණයි, ජයගන්නේ, එනම්, ඔවුන් ලෝකය පාලනය කරයි. රාවණගේ සමාජයට අයත් අය මෙය නොදනී. මේ සඳහා බොහෝ ප්‍රවේසම් වීම අවශ්‍යයි. අවසර නොමැතිව කිසිම කෙනෙකුට මෙහි පැමිණීමට නොහැක. මෙය සංචාරකයන්ගේ ස්ථානයක් නොවෙයි. කෙටි කාලයකදී නීති බොහෝ තදින් ක්‍රියාත්මක වනු ඇත, මන්ද මෙය වඩාත්ම පූජනීය ස්ථානයයි. ශිව බාබාට ඉන්ද්‍රා යැයිද කියයි. මෙය ඉන්ද්‍රාගේ අධිකරණයයි. මිනිසුන් මැණික් 9ක් සහිත මුදු පළඳියි. එහි පච්ච මැණිකක් මෙන්ම පුෂ්පරාගයක්ද ඇත. මේ සියලුම නම් සුරංගනාවන්ටද දී තිබේ. ඔය ජීවාත්ම පියාසර කරන සුරඟනාවන්ය. ඔබගේ වර්ණනාව මෙයයි. කෙසේවෙතත්, ඒ මිනිසුන්ට මෙම කාරණා ගැන කිසි දෙයක් නොවැටහෙයි. ඔවුන් පළඳින මුදු වල, ඊට අමතරව වෙනත් මැණික් ද තිබේ. ඇතැම් ඒවා රුපියල් දහසක් වටිනා අතර වෙනත් තවත් ඒවා රුපියල් 10 සිට 20 ක් වටියි. ඔය දරුවන්ද අංකානුරූපයි. සමහරු ඉගෙන ගෙන අධිපතියන් වෙයි. තවත් අය ඉගෙනගෙන සේවකයන් හෝ දාසයන් වෙයි. රාජධානියක් ස්ථාපිත වෙනවා. එබැවින් පරමාත්ම පියා මෙතැන අසුන්ගෙන ඔබට උගන්වනවා. ඔහු ඉන්ද්‍රා (වැහි දෙවියන්) වශයෙන්ද හැඳින්වෙයි. මෙය ඥාන වර්ෂාවයි. පරම පියා හැර වෙනත් කිසිවෙකුට ඔබට ඥානය ලබා දිය නොහැක. ඔබගේ අරමුණ සහ ඉලක්කය මෙයයි. මෙම ඥානය කියා දෙන්නේ පරමාත්ම දෙවියන් බව ඔබට විශ්වාස නම්, ඔබ කිසිදා මෙය හැර නොයයි. ගල් වැනි බුද්ධි ඇති අයට ඊතලය කිසි විටෙක නොවදියි. ඔවුන් පැමිණ, පසුව, ගමන් කරන අතර ඇද වැටෙයි. චක්‍රයෙන් භාගයක්ම ඔබගේ සතුරන් වී ඇත්තේ පාපයන් පහයි. ඒවා ඔබව ශරීර අවධානයට ගෙනැවිත් ඔබට පහර දෙයි. එවිට ඔබ, ඥානයෙන් විශ්මයට පත් වී, ඥානයට සවන් දී, ඒ ගැන කතා කර,

ඉන්පසුව අතහැර පලා යන අය බවට පත්වෙයි. මායා බොහෝ බලවත්ය. ඇය එක් පහරකින් ඔබ බිම හෙළයි. ඔබ කිසිදා නොවැටෙන බව සිතා සිටින නමුත්, මායා ඔබට පහර දෙයි. මෙහි පිරිමින් සහ ස්ත්‍රීන් යන දෙපිරිසම පාරිශුද්ධව රැඳෙයි. ඔවුන්ව මෙසේ කළ හැක්කේ පරමාත්ම දෙවියන් හැර වෙනත් කිසිවෙකුට නොව. දේවමය දූත මෙහෙය මෙයයි. පියාට තොටියා යැයිද කියන අතර, ඔරු වන්නේ ඔබලාය. තොටියා පැමිණෙන්නේ සියල්ලන්ගේම ඔරු එතෙර කරවීමටයි. සත්‍යයේ ඔරුව පැද්දෙන නමුත් එය කිසිදා නොගිලෙන බව, කියයි. බොහෝ විවිධ නිකායන් සහ ඇදහිලි තිබේ. ඥානය සහ භක්තිය අතර සටනක් තිබෙන්නාක් මෙනි. විටෙක භක්තිය ජයගන්නා නමුත් අවසානයේදී ඥානය ජයගනී. භක්ති මාර්ගයේ සටන්කාමීන් කෙතරම් ශ්‍රේෂ්ඨද බලන්න! අර්ජුන, බීෂ්මා ආදි වශයෙන් නම් කරන ලද, ශ්‍රේෂ්ඨ සටන්කාමීන් ඥාන මාර්ගයේද සිටියි. ඔවුන් අසුන්ගෙන ඒ සියලු කතාපුවත් ලියා ඇත. එම ප්‍රශංසාව අයත් වන්නේ ඔබටයි. ඔබ දැන් ඔබගේ ප්‍රධාන නළු, නිළි චරිත රඟපාමින් සිටියි. යුද්ධය සිදුවන්නේ මේ කාලයේදීය. මෙම කාරණා කෙසේවත් නොවැටහෙන අය, ඔබ අතරේද සිටියි. ඊතලය වදින්නේ ඉතා හොඳ අයට පමණයි. තුන්වෙනි පංතියේ අයට මෙහි අසුන්ගැනීමට නොහැකි වෙයි. දවසින් දවස, නීති, තව තවත් තද වෙයි. ගලක් වැනි බුද්ධි තිබෙන සහ කිසි දෙයක් නොවැටහෙන අයට, මෙහි පැමිණ අසුන් ගැනීම නීතියට පටහැනිය. මෙම ශාලාව, වඩාත්ම පූජනීය වූ ස්ථානයයි. පාප් වහන්සේ පූජනීය බව කියයි. පූජනීය අය අතරින් වඩාත්ම පූජනීය වන්නේ මෙම පියාය. පියා පවසන්නේ මා සෑම කෙනෙකුටම යහපත සැලසිය යුතුයි. සෑම දෙයක්ම විනාශ වීමට යනවා. මෙම දේවල් සෑම කෙනෙකුටම වැටහෙන්නේ නැත. ඔවුන් මේවාට සවන් දුන්නත්, ඒවා එක් කණකින් ගෙන, අනෙත් කණෙන් පිටකර හරියි. ඔවුන්ද කිසිවක් ධාරණය නොකරන අතර, අන් අයට ධාරණය කිරීමට දිරි ගන්වන්නේද නැත. එවන් බිහිරි සහ ගොළු අය බොහෝ සිටියි. පරම පියා පවසන්නේ නරක දේට සවන් නොදෙන්න, නරක දේ නොදකින්න... මෙය වඳුරන්ගේ පිංතූරයකින් ඔවුන් පෙන්වා තිබේ. කෙසේවෙතත්, මෙය බලපාන්නේ මනුෂ්‍යයන්ටයි. මෙකල, මනුෂ්‍යයන් වඳුරන්ටත් වඩා අන්තයි. නාරද ගැන කතාපුවතක් තිබේ. ඔහුට මෙසේ කියන ලදී තමන්ගේම මුහුණ දෙස බලා, පාපයන් පහ ඔබ තුළ නොමැතිද කියා පිරික්සන්න. ඔබට දර්ශන ලැබෙන ආකාරයෙන්, ඔවුන්ට හනුමාන් ආදීන්ගේ දර්ශන ලැබෙයි. පරම පියා පවසන්නේ මෙය සෑම චක්‍රයකදීම සිදුවෙයි. ස්වර්ණමය යුගයෙදී මේ කිසි දෙයක් පවතින්නේ නැත මෙම පැරණි ලෝකය අවසන් වෙයි. ඔවුන් එම රාජධානිය, පෙර චක්‍රයේද පාලනය කළ බව, බුද්ධිය තුළ, බොහෝ ස්ථිර විශ්වාසයක් ඇති අයට වැටහෙයි. පරම පියා පවසන්නේ දරුවනි, දැන් දිව්‍යමය ගුණධර්ම ධාරණය කරගන්න. නීතියට පටහැනි කිසිවක් නොකරන්න. ප්‍රශංසාවේදී මෙන්ම අපහාසයේදීද ඉවසිලිවන්ත වන්න. කිසි තරහක් තබා නොගන්න. ඔබ බොහෝ උසස් ශිෂ්‍යයින්! පරමාත්ම දෙවියන් වන පරම පියා ඔබට උගන්වනවා. ඔහු ඔබට සෘජුවම උගන්වයි. කෙසේවෙතත්, ඔහු සාමාන්‍ය සිරුරක සිටින නිසා, බොහෝ දරුවන්ට මෙය අමතක වෙයි. පරම පියා පවසන්නේ ඔබට ශාරීරික කෙනා දෙස බැලීමෙන් එතරම් ඉහළ යෑමට නොහැකි වෙයි. ජීවාත්මය දෙස බලන්න. ජීවාත්මය, නළල මැද වාසය කරයි. ජීවය මෙයට සවන් දී, හිස වනමින් එකඟත්වය පල කරයි. සෑම විටෙකම ජීවාත්මයන්ට කතා කරන්න. ඔය ජීවාත්මයන් ඔබගේ සිරුරේ සිහසුන් මත අසුන්ගෙන සිටියි. ඔබ තමෝප්‍රධාන්ව සිටි අතර දැන් සතෝප්‍රධාන් විය යුතුයි. ඔබ තමන් ජීවාත්මයක් බව සලකා, පරම පියා සිහි කරන විට, ශරීරය පිළිබඳ අවධානය බිඳී යයි. චක්‍ර භාගයකම ශරීර අවධානය තිබේ. මෙකල, සෑම කෙනෙක්ම සිටින්නේ ශරීර අවධානයෙනි. පරමාත්ම පියා පවසන්නේ දැන් ජීවාත්ම අවධානයට පත් වන්න! සෑම දෙයක්ම ධාරණය කරගන්නේ ජීවාත්මයයි. කෑම කන්නේ, බොන්නේ, ජීවාත්මයයි. පරමාත්ම පියාට අභෝග්තා (කිසි දෙයක් අත්විඳීම ඉක්මවා සිටින කෙනා) යැයි කියයි. අශාරීරික කෙනා ඔහුයි. සෑම දෙයක්ම කරන්නේ ශාරීරික ජීවයි. ඔහු කිසි දෙයක් කන්නේ හෝ බොන්නේ නැත ඔහු අභෝග්තාය. ඒ මිනිසුන් ඉන්පසුව මෙය අනුකරණය කරයි. ඔවුන් බොහෝ සෙයින් මනුෂ්‍යයන්ව රවටයි! සියලුම දැනුම ඔබගේ බුද්ධිය තුළ තිබේ. පෙර චක්‍රයේදී මෙය වටහාගත් අය, දැන් එය වටහාගනී. පරම පියා පවසන්නේ සෑම චක්‍රයකදීම මා පැමිණ ඔබට උගන්වා, නොබැඳි නිරීක්ෂකයෙක් ලෙසින් සෑම දෙයක්ම නරඹන්නෙමි. ඔබ දරන උත්සාහයට අනුව, අංක පිළිවෙලට, ඔබ පෙර චක්‍රයේදී ඉගෙනගත් සෑම දෙයක්ම, ඉගෙනගනීවි. එයට කාලයක් ගතවෙයි! ඔවුන් කියන්නේ කලි යුගයට තව වසර 40,000 ක් ඉතිරිව ඇත. මින් කියැවෙන්නේ ඔවුන් උපරිම අන්ධකාරයේ සිටින බවයි. එයට අවිද්‍යාවේ අන්ධකාරය යැයි කියයි. භක්ති මාර්ගය සහ ඥාන මාර්ගය අතර, දිවා, රාත්‍රිය මෙන් වෙනසකි. මෙයද වටහාගත යුතු කාරණාවකි. ඔය දරුවන් බොහෝ සතුටෙහි ගිලී සිටිය යුතුයි. ඔබට සෑම දෙයක්ම තිබේ ඔබට ආශාවන් නොමැත. පෙර චක්‍රයේදී වුණු එම ආකාරයෙන්ම, ඔබගේ සියලුම ආශාවන් ඉටු වන බව, ඔබ දන්නවා, ඔබ පූර්ණ තෘප්තිමත්භාවයෙන් සිටින්නේ මේ නිසාය. ඔබට උපතින් උපතට රාජධානියක් ලැබෙයි. සේවකයන් සහ දාසියන් වීමට සිටින අයට

එතරම් සතුටක් නොලැබෙයි. ඔබ පූර්ණ එඩිතර සටන්කාමීන් විය යුතුයි. ඔබව චංචල කරවීමට මායාට නොහැකි විය යුතුයි. පරම පියා පවසන්නේ ඔබගේ දෑස පිළිබඳව ඔබ බොහෝ ප්‍රවේසම් විය යුතුයි කිසිම දූෂිත බැල්මක් නොතිබිය යුතුයි. ඇතැම් විට ස්ත්‍රියක් දුටු විට, ඒවා දඟකාරකම් කරයි. අහා! ඔබ සහෝදර සහෝදරියන්, කුමාර් සහ කුමාරීන්ය, එබැවින් ඔබගේ භෞතික ඉන්ද්‍රියන් දඟකාරකම් කරන්නේ මන්ද? මායා, මහා කෝටිපතියන් ආදීන් පවා අවසන් කර දමයි! මායා දුගියන්වද සම්පූර්ණයෙන්ම මරා දමයි. එවිට ඔවුන් පවසන්නේ බාබා, මා පහර කෑවා. අහා, වසර 10 කට පසුවත් ඔබ පරාජය වූවා! දැන් ඔබ අපායේ අන්ත අගාධයට ඇද වැටෙයි. ඔවුන්ගේ අභ්‍යන්තර තත්ත්වය කෙබඳුද කියා ඔබට වටහාගැනීමට හැකි වෙයි. ඇතැමුන් ඉතා හොඳ සේවය කරයි. කුමරියන්, බිෂාම්පිතමායිට පවා ඊතල විද්දා. මෙම දේවල් සුළු වශයෙන් ගීතාවේ සඳහන් කර ඇත. දෙවියන්ගේ වදන් තිබේ. ගීතාව පැවසුවේ ක්‍රිෂ්ණා දෙවියන් නම්, මෙසේ කියන්නේ මන්ද 'මා කවුරුන්ද, කුමක් වැනිද කියා නිවැරදිව දන්නේ ඉතාමත්ම සුළු පිරිසක් පමණයි'? ක්‍රිෂ්ණා මෙහි සිටියේ නම්, ඔවුන් කුමක් කරයිද කියා ඔබට සිතා ගැනීමට නොහැක! ක්‍රිෂ්ණා එම සිරුරෙන් පවතින්නේ ස්වර්ණමය යුගයේය. ක්‍රිෂ්ණාගේ අවසන් උපතේදී එම සිරුරට මා ඇතුළු වන බව, ඔවුන් නොදනී. සෑම කෙනෙක්ම සැනෙකින් ක්‍රිෂ්ණා ඉදිරියට දිව එනු ඇත. පාප් තුමා පැමිණෙන විට, විශාල පිරිසක් ඔහු ඉදිරියේ එකතු වෙයි. මෙකල, සෑම කෙනෙක්ම අපවිත්‍ර මෙන්ම තමෝප්‍රධාන් බව, මිනිසුන්ට නොවැටහෙයි. ඔවුන් පවසන්නේ අහෝ පාරිශුද්ධකරු වඩිනු මැනව! කෙසේවෙතත්, ඔවුන් අපවිත්‍ර බව ඔවුන් සලකන්නේ නැත. පරමාත්ම පියා දරුවන්ට ඉතා හොඳින් විස්තර කරයි. සෑම මධ්‍යස්ථානයකම සිටින විශේෂ දරුවන් වෙතට බාබාගේ බුද්ධිය යයි. විශේෂයෙන් ආදරණීය වූ දරුවන් බොහොමයක් මෙහි පැමිණි විට, මා මෙහිදී ඔවුන් දෙස බලන්නෙමි. එසේ නැත්නම් මට ඔවුන් ගැන පිටතදී සිතන්නට වෙනවා. මා ඔවුන් ඉදිරියේ ඥානයේ නර්ථනය සිදුකරන්නෙමි. වැඩි දෙනෙක් ඥානය ඇති ජීවාත්ම වන විට, බොහෝ සතුටක් තිබේ. දියණියන්ට බොහෝ පහරදීම් සිදුවෙයි. ඔවුන්ට සෑම චක්‍රයකදීම බොහෝ සෙයින් දරාගැනීමට සිදුවෙයි. ඥානය ගැනීමෙන් පසුව, ඔවුන් භක්තියේ යෙදීමද නවතා දමයි. ඔවුන්ගේ නිවසේ වන්දනා කරන කුටියක් හෝ දේවාලයක් තිබී, සැමියා සහ බිරිඳ යන දෙදෙනාම භක්තියේ යෙදෙන නමුත්, පසුව බිරිඳ ඥානයට නැඹුරු වී, භක්තියේ යෙදීම නතර කළහොත්, බොහෝ කලබල ඇතිවෙයි. ඇය පාපයේ නොගැලෙන අතර, ආගමික පත පොත හැදෑරීමද නවතයි, එබැවින් රණ්ඩු ඇතිවෙයි. මෙහි බොහෝ බාධක ඇත. වෙනත් ආගමික හමුවීම් වලට යෑමෙන් ඔවුන් ඔබව වලක්වන්නේ නැත. මෙහි තිබෙන්නේ පාරිශුද්ධත්වය පිළිබඳ කරුණකි. පිරිමින්ට නිවෙස් වල සිටීමට නොහැකි වූ විට, ඔවුන් වන ගත වෙයි. ස්ත්‍රීන් කොහේ යන්නද? අපායේ දොරටුව වන්නේ ස්ත්‍රීන් බව, ඔවුන් විශ්වාස කරයි. පරම පියා පවසන්නේ ඔවුන් දිව්‍යලෝකයේ දොරටුවයි. ඔය දියණියන් දෙව්ලොව ස්ථාපිත කරනවා. පෙරකල, ඔබ අපායට දොරටුව විය. දැන් දිව්‍යලෝකය ස්ථාපිත වෙනවා. ස්වර්ණමය යුගය, දෙව්ලොවට දොරටුව වන අතර කලි යුගය, අපායේ දොරටුවයි. මෙය වටහා ගත යුතු දෙයකි. ඔය දරුවන්ද ඔබගේ උත්සාහයන් වලට අනුව, අංක පිළිවෙලට මෙය වටහාගනී. ඔබ පිවිතුරුව රැඳී සිටින නමුත් ඔබ ඥානය ධාරණය කරගන්නේ අංක පිළිවෙලටයි. ඔබ එයින් ඉවත් වී, දැන් මෙහි අසුන්ගෙන සිටියි. කෙසේවෙතත්, ඔබ දැන් ඔබගේ පවුලේ අය සමඟ ගෘහයේ වාසය කළ යුතු බව, ඔබට විස්තර කරදී තිබේ. ඔවුන්ට බොහෝ අපහසුතා තිබේ! මෙහි ජීවත් වන අයට කිසිම අපහසුතාවයක් නැත. එබැවින් පරමාත්ම පියා විස්තර කරන්නේ තම පවුලේ අය සමඟ නිවසේ වාසය කරමින් නෙළුම් මලක් මෙන් පිවිතුරුව රැඳී සිටින්න. මෙය මෙම එක් අවසන් උපත පිළිබඳ කාරණාවකි. තම පවුලේ අය සමඟ නිවසේ වාසය කරන අතර, තමන් ජීවාත්මයක් බව සලකන්න. මෙයට සවන් දෙන්නේ ජීවාත්මය වන අතර, මෙය බවට පත් විය යුත්තේද ජීවාත්මයයි. සෑම උපතකදීම විවිධ ඇඳුම් පළඳින්නේ ජීවාත්මයි. ජීවාත්ම වන අප, දැන් ආපසු නිවසට යා යුතුයි. අපි පරමාත්ම පියා සමඟ යෝගාවේ සිටිය යුතුයි. ප්‍රධානතම දෙය මෙයයි. පියා පවසන්නේ මා කතා කරන්නේ ජීවයන්ටයි. ජීවාත්මය, නළල මැද වාසය කරමින්, මෙම ඉන්ද්‍රියන් මඟින් සවන් දෙයි. ජීවාත්මය මෙම සිරුර තුළ නොමැති විට, සිරුර, මළමිනියක් බවට පත්වෙයි. පරමාත්ම පියා පැමිණ බොහෝ සේ ආශ්චර්යමත් ඥානය ලබා දෙයි. පරමාත්ම ජීවය හැර වෙනත් කිසිවෙකුට මෙම දේවල් විස්තර කළ නොහැක. සන්‍යාසීන් ආදිය ජීවාත්ම දෙස නොබලයි. ඔවුන් සලකන්නේ ජීවාත්මයක්, පරමාත්ම ජීවය ලෙසයි. ජීවයක්, ක්‍රියාවල ඵලයේ බලපෑමෙන් නිදහස් බව ඔවුන් ඉන්පසුව පවසන අතර, එබැවින් ඔවුන්ගේ සිරුරු සේදීමට ගංගා නදියට යයි. අපවිත්‍ර වන්නේ ජීවාත්මය බවත් සෑම දෙයක්ම සිදු කරන්නේ ජීවාත්මය බවත් ඔවුන්ට නොවැටහෙයි. පරමාත්ම පියා දිගින් දිගටම ඔබට විස්තර කරයි. මෙසේ නොසිතන්න මම අහවල් කෙනාය, මට අහවල් තත්ත්වය තිබේ... නැහැ, සියල්ලන්ම ජීවාත්මයි. කිසිම කුල ආදී භේදයක් නොතිබිය යුතුයි. තමන් ජීවාත්මයක් බව සලකන්න. රජය කිසිම ආගමක් ගැන විශ්වාස නොකරයි. ඒ සියලුම

ආගම් ශාරීරික වන නමුත් සියලුම ජීවාත්මයන්ගේ පියා වන්නේ එක්කෙනෙක් පමණයි. ඔබ බැලිය යුත්තේ ජීවාත්ම දෙසයි. සියලුම ජීවාත්මයන්ගේ ආදිතම ධර්මය වන්නේ සාමයයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබට ඇසෙන සියලුම නිෂ්ඵල දේවලට එක් කණකින් සවන් දී ඉන්පසුව අනෙක් කණෙන් එය පිට කරන්න. කිසිම නරක දෙයකට සවන් නොදෙන්න, නරක දේ නොදකින්න! පරමාත්ම පියා ඔබට ලබා දෙන ඉගැන්වීම් ධාරණය කරගන්න.
2. කිසිම සීමිත ආශාවක් ඇති කර නොගන්න. ඔබගේ දෑස ගැන බොහෝ ප්‍රවේශම් වන්න. කිසිම සාපරාදී බැල්මක් නොතිබිය යුතුයි. ඔබගේ භෞතික ඉන්ද්‍රියන් කිසිවක් දඟකාරකම් නොකළ යුතුයි. සතුටින් පිරී සිටින්න.

**වරදානය:** නොබැඳි නිරීක්ෂකයෙකු ලෙස මායාගේ ක්‍රීඩා නිරීක්ෂණය කිරීමෙන් ඔබ නිරන්තරව මායාගේ ක්‍රීඩා බියෙන් තොරව ජයග්‍රහණය කරන්නෙකු වේවා.
කාලයෙන් කාලයට, ඔය දරුවන්ගේ අවධිය දියුණු වෙනවා. එලෙසම, දැන් මායාගේ ප්‍රහාරයක් ඇති නොවේවා. මායාගේ පැමිණීම ඔබට ආචාර කිරීමට මිස පහර දීමට පැමිණීමක් නොවේවා. මායා පැමිණියත් ඇයව ක්‍රීඩාවක මෙන් නිරීක්ෂණය කරන්න. ඔබ නොබැඳි නිරීක්ෂකයෙකු ලෙසින් සීමිත ක්‍රීඩාවක් නරඹන අකාරයට ඇයව අත්දකින්න. මායාගේ ස්වරූපය කොතරම් බියජනක වුවද කම් නැත, ඔබ ඇයව ක්‍රීඩාවක සෙල්ලම් භාණ්ඩයක් ලෙස දකින්නේ නම්, ඔබට මහත් සතුටක් ඇතිවනු ඇත. එවිට ඔබ ඇයට බිය බිය නොවනු ඇත. නොබැඳි නිරීක්ෂකයින් සහ ක්‍රීඩකයින් ලෙස මායාගේ ක්‍රීඩා නිරන්තරයෙන් නිරීක්ෂණය කරන දරුවන් නිරන්තරව නිර්භයව සිටින අතර එමඟින් මායා ජය ගන්නන් බවට පත්වේ.

**පාඨය:** කෝපය ඔබට සමීප විය නොහැකි තරම්, එවන් ස්නේහ සාගරයක් වන්න.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

කර්මතීත් වීම යනු ඔබේ ක්‍රියාවන් වලට ඇලී නොසිටීම, ඔබේ ක්‍රියාවන්ට යටත් නොවී සිටීමයි. නිදහස්ව සිටින අතර ඔබේ භෞතික අවයව ක්‍රියා කරවීමට සලස්වන්න. සියල්ල කරන අතරතුර කිසිවක් කිරීමෙන් නිදහස් වූ කෙනෙකු වීම, නෑ සබැඳියාවක හෝ සම්බන්ධතාවයක සිටියදී කර්මතීත් වීම පිළිබඳව ප්‍රශංසාව තිබේ. ඔබට එවැනි අවධියක් තිබේද? එහිදී කිසිදු බැඳීමක් තබා නොගන්න සහ බැඳීමෙන් යුතුව කිසිදු සේවාවක් සිදු නොකරන්න, නමුත් එය උපකරණයක් ලෙස කරන්න. මෙය කිරීමෙන්, ඔබ පහසුවෙන් කර්මතීත් වනු ඇත.